# ලංසු ආරාධනයයි

## ප්‍රධාන ලේකම් කාර්යාලය - මධ්‍යම පළාත් සභාව

## ජාතික තරඟකාරී මිල ගණන් කැඳවීම (NCB)

## හදිසි, ඉදිකිරීම් / නඩත්තු / අලුත්වැඩියා සඳහා කොන්ත්‍රාත් ආයතන ලියාපදිංචි කිරීම - 2025 වර්ෂය

මධ්‍යම පළාත් සභාවට අයත් නිර්මිත පරිසරයේ (Built Environment) හදිසි, ඉදිකිරීම් /නඩත්තු / අලුත්වැඩියාවන් කඩිනමින් ඉටු කර ගැනීමේ අවශ්‍යතාවය මත නැවත ප්‍රසම්පාදනයකින් තොරව ඉටු කරවා ගැනීමේ අරමුණින් කොන්ත්‍රාත් ආයතන ලියාපදිංචි කිරීම සිදු කරනු ලබයි. එම ලියාපදිංචිය සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් මධ්‍යම පළාත් සභාවේ සියලු ආයතන වෙනුවෙන් යෝග්‍යතාපූර්ණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි, අසාධු ගත නොවූ කොන්ත්‍රාත් ආයතන වලින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. මෙම ලංසු ආරාධනය ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ (NCB) ක්‍රමයට ක්‍රියාත්මක කරනු ලබන අතර රාජ්‍ය මුදල් චක්‍රලේඛ 04/2016 I හා II අනුව, ප්‍රාදේශිය ලංසුකරුවන්ට ප්‍රමුඛතාවය ලබා දීම සිදු කරනු ලැබේ.

මධ්‍යම පළාත් සභාව විසින් 2025 වර්ෂය සඳහා සකස් කරනු ලබන අනුමත ගාස්තු උපලේඛනයේ වැට් රහිත හා උඩිස් හා ලාභාංශ වියදම් රහිත මූලික ගාස්තු පදනම් කොට ගෙන සකස් කරනු ලබන සෘජු පිරිවැය ඇස්තමේන්තුවට ඔබ විසින් ඉල්ලුම් කරනු ලබන ලාභාංශ හා උඩිස් වියදම් (Overhead and Profit) ප්‍රතිශතය හා ඔබ විසින් එක් එක් කාණ්ඩ යටතේ ඇති එක් එක් අයිතම සඳහා ඉල්ලුම් කරනු ලබන ප්‍රමුඛතාවය පදනම් කර ගෙන සුදුසුකම් ලත් කොන්ත්‍රාත් ආයතන ලියාපදිංචි කර ගනු ලැබේ. එසේ ලියාපදිංචි කර ගන්නා කොන්ත්‍රාත් ආයතන සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 05 දක්වා වූ හදිසි, ඉදිකිරීම් / නඩත්තු / අලුත්වැඩියා කොන්ත්‍රාත් පිරිනමනු ලබයි.

ලියාපදිංචි කර ගනු ලබන කොන්ත්‍රාත් ආයතන පහත පරිදි කාණ්ඩ 05ක් යටතේ ලියාපදිංචි කර ගනු ලැබේ.

A. තෝරාගත් ප්‍රධාන ගොඩනැඟිලි / ආයතන
B. පළාත් සභාවට අයත් වෙනත් ගොඩනැඟිලි
C. පළාත් මාර්ග
D. පළාත් වාරිමාර්ග
E. විදුලි හා විද්‍යුත් තතැදුම් හා සවිකිරීම්

ලියාපදිංචිය සඳහා ලංසු පත්‍රයේ ඒ ඒ කාණ්ඩ යටතේ සඳහන් කර ඇති අවම සුදුසුකම් සපුරාලිය යුතු ය. මෙම ලියාපදිංචිය 2025 ජනවාරි 01 දින සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා වර්ෂයක් සඳහා වලංගු වේ. මේ පිළිබඳ වැඩිමනත් විස්තර පල්ලේකැලේ, මධ්‍යම පළාත් සභා සංකීර්ණය, මධ්‍යම පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයට පැමිණ හෝ දුරකථන/ෆැක්ස් අංක 081-2233725, dcscpeng@gmail.com ඊමේල් ලිපිනයෙන් හෝ www.cs.cp.gov.lk වෙබ් අඩවිය මඟින් ලබා ගත හැකි අතර, සතියේ වැඩ කරන ඕනෑම දිනක පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා කාර්යාල වේලාවන් තුළ ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කල හැකි ය.

ලංසු පෝරම ලබා ගැනීම සඳහා මධ්‍යම පළාත් සභා සංකීර්ණ ලංකා බැංකු ශාඛාවේ **ප්‍රධාන ලේකම්- මධ්‍යම පළාත නමින් ගිණුම් අංක "33790 " ට ආපසු නොගෙවන රු.1000.00 ක මුදලක්** බැර කොට එම රිසිට් පත සතියේ වැඩ කරන දිනවල මධ්‍යම පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයට ඉදිරිපත් කර ලංසු ලේඛන ලබා ගෙන විධිමත්ව සම්පූර්ණ කොට ඉදිරිපත් කල යුතුය. ලංසු ලියවිලි 2024.10.03 දින සිට 2024.10.23 දින දක්වා පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා කාර්යාල දිනවල නිකුත් කරනු ලැබේ.

සෑම ලංසුවක් සමඟම ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතු අතර, ඒ සඳහා රු.25,000.00 ක මුදලක් ප්‍රධාන ලේකම්- මධ්‍යම පළාත ලංකා බැංකුවේ ගිණුම් අංක "33790" ට බැර කර ඊට අදාළව නිකුත් කරනු ලබන ලදුපතේ පිටපතක් ඉදිරිපත් කිරීම හෝ ශ්‍රී ලංකා මහ බැංකුව පිළිගත් අනුමත වාණිජ බැංකුවකින් ප්‍රධාන ලේකම්, මධ්‍යම පළාත නමින් ලබාගත් ආපසු හැරවිය නොහැකි කොන්දේසි විරහිත පළමු ඉල්ලීමෙන්ම මුදල් කළ හැකි රු.50,000.00ක බැංකු ඇපකරයක් ඉදිරිපත් කිරීම කළ යුතුයි.

**පූර්ව ලංසු රැස්වීම 2024.10.14 දින පෙරවරු 10.00 ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ දී පවත්වනු ලැබේ.**

මුද්‍රා තැබූ ලංසු පිටපත් 02 කින් 2024 ඔක්තෝම්බර් මස 25 වන දින පෙ. ව. 10.00 වන පැයට පෙර නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය, මධ්‍යම පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ තබා ඇති මුද්‍රා තබන ලද ලංසු පෙට්ටියට බහාලිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" හදිසි, ඉදිකිරීම්/නඩත්තු / අලුත්වැඩියා කොන්ත්‍රාත් ආයතන ලියාපදිංචි කිරීම - 2025 වර්ෂය"**ලෙස සඳහන් කල යුතු අතර, ප්‍රමාද වී ලැබෙන ලංසු භාර ගනු නොලැබේ. එම ලංසු පත් විවෘත කිරීම එදිනම පෙ.ව 10.00 ට සිදු කරනු ලබන අතර ඒ සඳහා ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයන්ට සහභාගී විය හැකිය .

**නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) සහ ප්‍රසම්පාදන කමිටු සභාපති,**
**නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය,**
**මධ්‍යම පළාත් සභා සංකීර්ණය,**
**පල්ලේකැලේ**
**කුණ්ඩසාලේ.**
**2024.10.03**

## මධ්‍යම පළාතේ හදිසි, ඉදිකිරීම් / නඩත්තු / අලුත්වැඩියා සඳහා කොන්ත්‍රාත් ආයතන ලියාපදිංචි කිරීම 2025 වර්ෂය

### 01. ලියාපදිංචි කර ගැනීමේ අරමුණ

මධ්‍යම පළාත් සභාවට අයත් නිර්මිත පරිසරයේ හදිසි ඉදිකිරීම් / නඩත්තු / අලුත්වැඩියා අඛණ්ඩව වර්ෂය තුළ ඉටු කිරීම සඳහා කඩිනමින් ක්‍රියාත්මක වී නිර්මිතය යථා තත්ත්වයට පත් කර ගැනීමේ අවශ්‍යතාවය මත හදිසි, ඉදිකිරීම් / නඩත්තු / අලුත්වැඩියා නැවත ප්‍රසම්පාදනයකින් තොරව ඉටු කරවා ගැනීමේ අරමුණින් කොන්ත්‍රාත් ආයතන ලියාපදිංචි කිරීම සිදු කරනු ලබයි.

මධ්‍යම පළාත් සභාව විසින් 2025 වර්ෂය සඳහා සකස් කරනු ලබන අනුමත ගාස්තු උපලේඛනයේ වැට් රහිත හා උඩිස් හා ලාභාංශ වියදම් රහිත මූලික ගාස්තු පදනම් කොට ගෙන සකස් කරනු ලබන ඍජු පිරිවැය ඇස්තමේන්තුවට ඔබ විසින් ඉල්ලුම් කරනු ලබන ලාභාංශ හා උඩිස් වියදම් (Overhead and Profit) ප්‍රතිශතය හා ඔබ විසින් එක් එක් කාණ්ඩ යටතේ ඇති එක් එක් අයිතම සඳහා ඉල්ලුම් කරනු ලබන ප්‍රමුඛතාවය පදනම් කර ගෙන සුදුසුකම් ලත් කොන්ත්‍රාත් ආයතන ලියාපදිංචි කර ගනු ලැබේ. එසේ ලියාපදිංචි කර ගන්නා කොන්ත්‍රාත් ආයතන සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 05 දක්වා වූ හදිසි, ඉදිකිරීම් / නඩත්තු / අලුත්වැඩියා සඳහා පහත පරිදි කාණ්ඩ 5ක් යටතේ සුදුසුකම්ලත් කොන්ත්‍රාත් ආයතන ලියාපදිංචි කරගනු ලැබේ.

A කාණ්ඩය - ප්‍රධාන ගොඩනැගිලි/ආයතන
B කාණ්ඩය - පළාත් සභාවට අයත් ගොඩනැගිලි
C කාණ්ඩය - පළාත් මාර්ග
D කාණ්ඩය - පළාත් වාරිමාර්ග
E කාණ්ඩය - විදුලි හා යාන්ත්‍රික සේවා

මෙම ලියාපදිංචිය 2025.01.01 දින සිට 2025.12.31 දක්වා වර්ෂය සඳහා වලංගු වේ.

### 02. ලියාපදිංචිය සඳහා සම්පූර්ණ කළ යුතු සුදුසුකම්

- අසාධුගත නොවූ කොන්ත්‍රාත් ආයතනයක් වීම.
- 2024.10.25 දිනට වලංගු ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) අදාල ලියාපදිංචිය හා ශ්‍රේණිය.
- ලංසු පත්‍රයේ සියළු ආකෘතිවල ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

### 03. ලංසුකරුවන් වෙත උපදෙස්

I. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි වාර්තා පොතේ පිටපතක් අයදුම්පත්‍රය සමඟ අමුණා තිබිය යුතු ය.

II. මධ්‍යම පළාත් සභාව විසින් 2025 වර්ෂය සඳහා සකස් කරනු ලබන අනුමත ගාස්තු උපලේඛනයේ වැට් රහිත හා උඩිස් හා ලාභාංශ වියදම් රහිත මූලික ගාස්තු පදනම් කොට ගෙන සකස් කරනු ලබන ඍජු පිරිවැය ඇස්තමේන්තුවට ඔබ විසින් ඉල්ලුම් කරනු ලබන ලාභාංශ හා උඩිස් වියදම් (Overhead and Profit) ප්‍රතිශතය ලංසු ලෙස A,B,C,D හා E ආකෘති වල සඳහන් කළ යුතු ය.

III. A,B,C,D හා E ආකෘති වල ඔබගේ ප්‍රමුඛතා පිළිවෙල 1,2,3...... වශයෙන් සටහන් කළ යුතුය. එසේ නොමැති විට එහි සඳහන් පිළිවෙල ප්‍රමුඛතාවය ලෙස සලකනු ලැබේ.

V. A,B,C,D හා E යන සෑම ලංසු පත්‍රයකම පහළින් අත්සන යොදා මුද්‍රාව තැබිය යුතුය.

VI. ලංසු ඉදිරිපත් කිරීම ලියාපදිංචි පොතේ අයිතිකරු හෝ ඔහුගේ බලය ලත් පුද්ගලයෙකු විසින් ඉදිරිපත් කළ යුතු ය. (අදාල තහවුරු කිරීමේ ලිපිලේඛන ඉදිරිපත් කළ යුතුය.)

VII. ලියාපදිංචි වූ එක් එක් ආයතන සඳහා හදිසි, ඉදිකිරීම් / නඩත්තු / අලුත්වැඩියා වැඩසටහන් /වැඩ නියෝග පළාත් සභාවේ එක් එක් ආයතන විසින් යොමු කරනු ඇත.

VIII. සම්පූර්ණ කළ ලංසු පත්‍රය පහත සඳහන් ලිපිනයට 2024.10.25 දින පෙරවරු 10.00 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ තබා ඇති මුද්‍රා තබන ලද ලංසු පෙට්ටියට බහාලිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ " හදිසි, ඉදිකිරීම් / නඩත්තු / අලුත්වැඩියා සඳහා කොන්ත්‍රාත් ආයතන ලියාපදිංචි කිරීම - 2025 වර්ෂය" ලෙස සඳහන් කරන්න.

" නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය
මධ්‍යම පළාත් සභා සංකීර්ණය
පල්ලේකැලේ
කුණ්ඩසාලේ."

IX. සියළුම ලංසු සමග ආපසු ගෙවනු ලබන ලංසු ඇපකරයක් ලෙස රු**.25,000.00 ක** මුදලක් **ප්‍රධාන ලේකම් - මධ්‍යම පළාත නමින් පළාත් සභා සංකීර්ණයේ ලංකා බැංකුවේ ශාඛාවේ ගිණුම් අංක" 33790 "** ට බැර කර ඊට අදාළව නිකුත් කරනු ලබන ලදුපතේ පිටපතක් අයදුම්පත්‍රය සමඟ ඇමිණීම හෝ ශ්‍රී ලංකා මහ බැංකුව පිළිගත් අනුමත වාණිජ බැංකුවකින් **ප්‍රධාන ලේකම්, මධ්‍යම පළාත නමින් ලබාගත් ආපසු හැරවිය නොහැකි කොන්දේසි විරහිත පළමු ඉල්ලීමෙන්ම මුදල් කළ හැකි රු.50,000.00ක බැංකු ඇපකරයක්** ඉදිරිපත් කළ යුතු ය.

X. එම ලංසු ඇපකරය 2026.01.31 දින දක්වා වලංගු විය යුතුය.

XI. එක් එක් කාණ්ඩ යටතේ පහත පරිදි උපරිම අයිතම සංඛ්‍යාවක් ලියාපදිංචි කර ගනු ලැබේ. ඒ සඳහා එක් එක් අයිතමය යටතේ ඔබ විසින් ඉල්ලුම් කර ඇති උඩිස් හා ලාභාංශ ප්‍රතිශතය හා ඔබ විසින් ඉල්ලුම් කරනු ලබන ප්‍රමුඛතා අනුපිළිවෙල සැලකිල්ලට ගනු ලැබේ.

| කාණ්ඩය | එක් කොන්ත්‍රාත් ආයතනයක් සඳහා ලියාපදිංචි විය හැකි උපරිම අයිතම ප්‍රමාණය |
|---|---|
| A | 03 |
| B | 05 |
| C | 05 |
| D | සීමාවක් නොමැත |
| E | සීමාවක් නොමැත |

XII. ඉහත කොන්දේසි සපුරා නොමැති හා විධිමත්ව සම්පූර්ණ කර නොමැති ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

XIII. ප්‍රධාන ගොඩනැඟිලි යටතේ හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් එක් අයිතමයක් සඳහා ලියාපදිංචි කර ගනු ලබන උපරිම කොන්ත්‍රාත් ආයතන සංඛ්‍යාව ලබා දෙනු ලබන උඩිස් හා ලාභාංශ ප්‍රතිශත සැලකිල්ලට ගෙන තෝරා ගනු ලබන උපරිම කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව 08 කි.

XIV. ලංසු ඇගයීම් කටයුතු නිම කර හදිසි, ඉදිකිරීම් / නඩත්තු / අලුත්වැඩියා කොන්ත්‍රාත් ආයතන තෝරා ගැනීමේ අවසන් තීරණය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

XV. ලියාපදිංචිය සම්බන්ධයෙන් ඔබ ආයතනය දැනුවත් කරන අතර, ලියාපදිංචියෙන් අනතුරුව තෝරා නොගත් ලංසුකරුවන්ගේ ලංසු සුරක්ෂනය ඇප මුදල ද නිදහස් කරනු ලැබේ.

XVI. යම් ආයතනයක් ලියාපදිංචියෙන් අනතුරුව පළාත් සභාවේ අදාල අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, ආයතනයක් මගින් හදිසි, ඉදිකිරීම් / නඩත්තු / අලුත්වැඩියා කටයුතු පවරනු ලැබේ.

XVII. ලියාපදිංචි කර ගන්නා ලද අදාල ආයතනයක් වෙත කොන්ත්‍රාත් පිරිනැමීමෙන් පසු සතියක් තුළ හදිසි, ඉදිකිරීම් / නඩත්තු / අලුත්වැඩියා කොන්ත්‍රාත් ගිවිසුමට එළඹිය යුතුය.

XVIII. ලියාපදිංචියෙන් අනතුරුව පළාත් සභාවේ අදාල අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, ඒකකයක් මගින් එක් අවස්ථාවක දී පවරනු ලබන නඩත්තු කොන්ත්‍රාත්තුවක උපරිම වටිනාකම මිලියන 05 කි.මේ සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) ආයතනයේ Standard Bidding Document 3 (SBD 3 -2007) සම්මත ලංසු ලේඛනයේ කොන්ත්‍රාත් කොන්දේසි අදාල කරගනු ලැබේ.

XIX. සාර්ථකව අවසන් නොකළ බවට වාර්තාවූ හා ගිවිසුමට එළඹීම පැහැර හරින කොන්ත්‍රාත් ආයතනවල නඩත්තු ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කරනු ලබන අතර එවැනි කොන්ත්‍රාත් ආයතනවල ලංසු ඇපකරය රාජසන්තක කරනු ලැබේ. ඉදිරි වර්ෂ වලදී නඩත්තු කොන්ත්‍රාත් සඳහා තෝරාගැනීමේදී මේ සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.

XX. රාජ්‍ය මුදල් චක්‍රලේඛ 04/2006 (I )හා (II) අනුව, ප්‍රාදේශීය ලංසුකරුවන්ට 5% ප්‍රමුඛතාව ලබා දීම කරනු ලබන අතර ඒ සඳහා CIDA ආයතනයේ ලියාපදිංචි ලිපිනය ඊට අදාල ලිපිනය ලෙස සලකනු ලැබේ.

XXI. පූර්ව ලංසු රැස්වීම 2024.10.14 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ දි පෙ.ව.10.00 ට පැවැත්වේ. (ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්හට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී විය හැකි අතර, වැඩි විස්තර සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ දුරකථන අංක 081-2233725 මගින් විමසිය හැකි ය.)

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) ,<br>
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය,<br>
මධ්‍යම පළාත් සභා සංකීර්ණය,<br>
පල්ලේකැලේ,<br>
කුණ්ඩසාලේ.